**ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ - උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය - 2022**

---

ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ - උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල සූදානම වැඩිදියුණු කිරීම වන අතර ණය ගිවිසුමේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව ජාතික වරාය ප්‍රධාන සැලැස්ම අනුගමනය කරමින් වරාය පහසුකම් සංවර්ධනය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 729.65 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 5 ක් වන අතර එයින් රු.මිලියන 645.01 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 4.42 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 84.64 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘතිය එහි කටයුතු 2020 පෙබරවාරි 24 වන දින ආරම්භ කර 2021 මැයි 23 වන දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2023 මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මතය

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවාව සහ එහි විස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම 2020 දෙවන කාර්තුව වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සහ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2020 පෙබරවාරි 24 දින AECOM Infrastructure & Environment UK Limited වෙත පිරිනමා තිබුණු අතර, එදින සිට මාස 15ක් ඇතුළත ව්‍යාපෘතිය නිම කිරීමට සිදු විය. සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත්තුව යටතේ කටයුතු 2021 මැයි 23 දින වන විට නිම කර නොතිබුණු අතර 2023 මැයි 31 දින දක්වා දීර්ඝ කිරීම් හතරක් ලබා දී තිබුණි. 2023 මාර්තු 31 දිනට උපදේශන කොන්ත්‍රාත්තුවේ සමස්ත ප්‍රගතිය සියයට 95 ක් වූ අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවසන් වාර්තාව 2023 මාර්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉලක්කගත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි විය.

### 2.2 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය මගින් GOSL සහ ADB වියදම් යටතේ ව්‍යාපෘති වියදම් සඳහා රු.මිලියන 824ක මුදලක් වෙන් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 552ක් පමණක් වියදම් කර තිබුණි. | වාර්තා ලැබීමෙන් පසු අදියර ගෙවීම් අනුව ගෙවීම් සිදු කෙරේ. අවසාන EIA වාර්තාව ලැබීමෙන් පසු අවසාන ගෙවීම් නිදහස් කරනු ලැබේ. | වර්ෂය තුළ සත්‍ය වශයෙන්ම කළ හැකි කටයුතු සලකා බලා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කළ යුතු බව. |